සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය **භූගෝල විද්‍යාව - I** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- **ප්‍රශ්න අංක 01 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01 පෘථිවියේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කි.මී. මිලියන .... කි. (510 / 65610 / 1000)

02 පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන්නේ .... අසන්තතියෙනි. (ගුටෙන්බර්ග් / මොහොරොවිසික් / ලේමන්)

03 වායුගෝලයේ අඩුම උෂ්ණත්වයක් පවතින්නේ .... ගෝලයේ ය. (පරිවර්ති / අපරිවර්ති / මෙසෝ)

04 තිරිඟු වගාව සඳහා .... පස වැදගත් වේ. (චර්නොසම් / කබොක් / ලැටරයිට්)

05 නිලාවේලි ප්‍රදේශයේ .... ඛනිජය බහුලව ව්‍යාප්තවී ඇත. (සිලිකා / සර්කෝන් / ඉල්මනයිට්)

06 වර්තමානයේ ලොව ප්‍රමුඛ මෝටර් රථ නිෂ්පාදකයා වන්නේ .... යි. (ජපානය / චීනය / ඇමෙරිකා එක්සත් ජනපදය)

07 සුනාමි අයත් වන්නේ .... උපද්‍රව ගණයට ය. (භූ විද්‍යාත්මක / දේශගුණ විද්‍යාත්මක / ජෛව විද්‍යාත්මක)

08 ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය මගින් .... දූපත් නිර්මාණය වී තිබේ. (සුමාත්‍රා / හවායි / නිව්ගිනියා)

09 බලශක්ති උත්පාදනය සඳහා ශ්‍රී ලංකාව බහුලවම භාවිතා කරන ශක්ති මූලය .... වේ. (ජලය / ගල් අඟුරු / ජෛව ස්කන්ධ)

10 ශ්‍රී ලංකා 1 : 50,000 පරිමාණයේ සිතියමක වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් .... කි. (50,000 / 10,000 / 1000)

- **අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් ''නි'' යන්න වටා ද, වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.**

11 උන්නතාංශය සමග උෂ්ණත්වය පහළ යාම පරිවර්තිගෝලයේ විශේෂ ලක්ෂණයකි. (නි / වැ)

12 ඉන්දියාව ලොව වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන රටයි. (නි / වැ)

13 පෘථිවි කබොලේ ඉහළම තුනී ස්තරය පස වන අතර එය ජෛව පරිසරය මගින් නිරතුරුවම වර්ධනය වේ. (නි / වැ)

14 ශ්‍රී ලංකාවේ මුළු ශ්‍රම බලකායෙන් වැඩිම ප්‍රතිශතයක් කෘෂි අංශයේ රැකියාවල නිරතව ඇත. (නි / වැ)

15 මානුෂ සංවර්ධන දර්ශයක අනුව ලෝකයේ රටවල් සංවර්ධන කාණ්ඩ හතරකට බෙදා දක්වේ. (නි / වැ)

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **අංක 16 සිට 25 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

16 උතුරු අක්ෂාංශ 66½° රේඛාව .... වෘත්තය ලෙස හඳුන්වයි.

17 ශ්‍රී ලංකාවෙන් ලබාගන්නා මිනිරන්, ... මිනිරන් හා තලාතු මිනිරන් ලෙස වර්ග කෙරේ.

18 ගැඹුරු සාගරික ආගාධ බොහොමයක් .... සාගරය තුළ පිහිටා ඇත.

19 පෘථිවි ශිලා ගෝලය ප්‍රධාන භූ තැටි .... කින් හා සුළු භූ තැටි රාශියකින් සමන්විත වේ.

20 සමාන්තර හෙල්වැටි විහිදී ඇති ප්‍රදේශවල .... ජලවහන රටාවක් දැකිය හැකි වේ.

21 ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යොදවා ඇත්තේ .... දිස්ත්‍රික්කයේ ය.

22 1 : 50,000 සිතියම්වල විවිධ භූ ලක්ෂණ පෙන්නුම් කිරීම සඳහා .... යොදාගනී.

- **අංක 23 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ලංකා සිතියම යොදාගන්න.**

23 අංක 2 මගින් දැක්වෙන භූ විෂමතා කලාපය වන්නේ .... යි.

24 තේ වගාව බහුලව ව්‍යාප්ත වී ඇති භූ විෂමතා කලාපය දැක්වෙන්නේ අංක .... මගිනි.

25 අංක 4 න් දැක්වෙන මුහුදු සීමාව .... මුහුද ලෙස හඳුන්වයි.



- **අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවල ''අ'' සහ ''ආ'' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ''අ'' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට ''ආ'' තීරුවේ ඇති තොරතුරු ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

26

''අ''		''ආ''	
බලාගාර		පිහිටා ඇති ප්‍රදේශ	
1.	සුළං බලාගාරය	A	බරුතකන්ද
2.	තාප බලාගාරය	B	පුත්තලම
3.	සූර්ය ශක්ති බලාගාරය	C	කෙරවලපිටිය
		D	ලක්ෂපාන

(1) BAC (2) ACD (3) BCA (4) DBA (.........)

27 "අ" "ආ"

ප්‍රධාන කඳුවැටි		පිහිටා ඇති මහාද්වීප	
1.	රොකී	A	ආසියා
2.	ඇල්ප්ස්	B	උතුරු ඇමරිකා
3.	ඇට්ලස්	C	අප්‍රිකා
		D	යුරෝපා

(1) DAB (2) CDA (3) BAC (4) BDC (.........)

28 "අ" "ආ"

පර්යේෂණ ආයතන		පිහිටි ප්‍රදේශ	
1.	මාෂ භෝග පර්යේෂණ ආයතනය	A	අම්බලන්තොට
2.	වී පර්යේෂණ ආයතනය	B	ලුණුවිල
3.	පොල් පර්යේෂණ ආයතනය	C	අඟුණකොලපැලැස්ස
		D	කනන්විල

(1) CAB (2) DCB (3) CDA (4) BAD (.........)

29 "අ" "ආ"

යකඩ හා වානේ නිෂ්පාදන රටවල්		නිෂ්පාදන මධ්‍යස්ථාන	
1.	එක්සත් ජනපදය	A	බර්මිංහැම්
2.	එක්සත් රාජධානිය	B	බීජිං
3.	චීනය	C	ටෝකියෝ
		D	පිට්ස්බර්ග්

(1) ADB (2) DAB (3) CAB (4) DAC (.........)

30 "අ" "ආ"

සුළි සුළං ඇතිවන ප්‍රදේශ		හඳුන්වන නම	
1.	උතුරු අත්ලාන්තික් සාගරය	A	සයික්ලෝන්
2.	ඕස්ට්‍රේලියාවේ වයඹ දිග වෙරළ	B	ටයිෆූන්
3.	බෙංගාල බොක්ක අවට	C	හරිකේන්
		D	විලිවිලීස්

(1) BCA (2) CBD (3) CDA (4) BDC (.........)

- **අංක 31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

31 විද්‍යුත් ක්‍රියාවලීන් බහුලව සිදුවන වායුගෝලීය ස්තරය කුමක් ද?

(1) පරිවර්තිගෝලය (2) අපරිවර්තිගෝලය

(3) මොසෝගෝලය (4) තාපගෝලය (.........)

32 සාගරික කබොල නිර්මාණය වී ඇත්තේ,

(1) මැග්නීසියම් වලිනි. (2) බැසෝල්ට් පාෂාණ වලිනි.

(3) ග්‍රැනයිට් පාෂාණ වලිනි. (4) සිලිකේට වලිනි. (.........)

33 මානව ක්‍රියාකාරකම් මත තීව්‍ර වන ස්වභාවික උපද්‍රවයක් ලෙස හැඳින්විය හැක්කේ පහත ඒවායින් කුමක් ද?

(1) ජල ගැලීම් (2) සුළි සුළං

(3) සුනාමි (4) භූමිකම්පා (.........)

34 විපරීත පාෂාණ වර්ග දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) නයිස්, ඩොලමයිට් (2) දියමන්ති, හුණුගල්

(3) ග්‍රැනයිට්, ගැබ්‍රෝ (4) ජිප්සම්, ගල්අඟුරු (.........)

35 පුනර්ජනනීය සම්පත් යුගලයක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ජලය, සරු පස (2) වනාන්තර, වනජීවීන්

(3) යපස්, පොසිල ඉන්ධන (4) සූර්යාලෝකය, පස (.........)

36 සෞම්‍ය කලාපීය වනාන්තර සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ජෛව විවිධත්වය ඉහළ ය.

(2) කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර ව්‍යාප්තව ඇත.

(3) සිසිර ඍතුවේ දී ගස්වල කොල හැලේ.

(4) මැහෝගනී, කළුවර. උන, ඇකේෂියා වැනි ශාක දැකිය හැක. (.........)

- **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A 1. සූර්ය ශක්තිය
2. බලශක්ති අර්බුදය

B 1. ආනයන
2. දේශීය නිෂ්පාදන

C 1. ගෝලීය උණුසුම් වීම
2. පහත් බිම් ජලයෙන් යටවීම

D 1. වර්ෂාපතනය
2. මිනිස් කටයුතු

37 පළමුවැන්න දෙවැන්නේ පැවැත්මට අහිතකර ලෙස බලපෑ හැකි යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A 2) B (3) C (4) D (.........)

38 පළමුවැන්න දෙවැන්නට පිළියමක් විය හැකි යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A 2) B (3) C (4) D (.........)

39 දෙවැන්න පළමුවැන්නේ අහිතකර ප්‍රතිඵලයක් බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A 2) B (3) C (4) D (.........)

40 පළමුවැන්න දෙවැන්නේ යහපතට මෙන්ම අයහපතටද හේතුවන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A 2) B (3) C (4) D (.........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය

භූගෝල විද්‍යාව - II

නම/ විභාග අංකයඃ

- මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්යය වේ. එහි (අ) , (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුයි.
- II කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

I - කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (iv) තෙක් ඇති ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) P - Q රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය කුමක් ද?

(තීර්යක් නිම්නය / ආයත නිම්නය / සුළං කපොල්ල)

(ii) A - B රේඛාවෙන් දක්වා ඇති බෑවුම කුමක් ද?

(අවතල බෑවුම / උත්තල බෑවුම / මොහොර බෑවුම)

(iii) C අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(රෝහල / ක්‍රිස්තියානි පල්ලිය / අක්ෂාංශ දේශාංශ ඡේදනය)

(iv) D අක්ෂරයෙන් කොටුකර ඇති ප්‍රදේශයේ වගා කර ඇති වැවිලි භෝගය කුමක් ද?

(තේක්ක / පයිනස් / යුකැලිප්ටස්)

(v) G චතුරස්‍රයෙන් පෙන්නුම් කරන ප්‍රදේශය ජනාවාසයක් වීමට බලපා ඇති ප්‍රධාන සාධකය කුමක් ද?

(vi) B411 මාර්ගයේ ගමන් කරන්නෙකුට හමුවන පාලම් සංඛ්‍යාව කීයද?

(vii) සිතියම් ප්‍රදේශය හරහා ඇති ප්‍රධාන ගංගාව ගලා බසින්නේ කුමන දිශාවට ද?

- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් ''නි'' යන්න ද, වැරදි නම් ''වැ'' යන්න ද සඳහන් කරන්න.

(viii) සිතියම් ප්‍රදේශය පළාත් දෙකකට අයත් වේ. (නි / වැ)

(ix) සිතියම් ප්‍රදේශයේ නිරිත හා ඊසාන කාර්තුවල ලඳුකැලෑ ව්‍යාප්තව පවතී. (නි / වැ)

(x) සිතියම් ප්‍රදේශයේ සමස්ත භූ දර්ශනය තැනිතලා බවක් පෙන්වයි. (නි / වැ)

(ලකුණු 10)

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ආ) ඔබවෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදාගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නය ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) අයිස්ලන්ත දූපත - A, B, C

(ii) ෂැංහයි නගරය - D, E, F

(iii) වොල්ගා ගඟ - G, H, J

(iv) නැස්කා තැටිය - K, L, M

(v) ඇපලේචියන් කඳු - P, Q, R (ල. 05)

(ඉ) ඔබවෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදාගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නය ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) විල්පත්තු ජාතික උද්‍යානය - A, B, C

(ii) ත්‍රිකුණාමලය - D, E, F

(iii) නිල්වලා ගඟ - G, H, J

(iv) කෘෂි තාක්ෂණික උද්‍යානය පිහිටි ගන්නෝරුව - K, L, M

(v) මැණික් ලැබෙන ඔක්කම්පිටිය - P, Q, R (ල. 05)

II - කොටස

(02) පහත රූප සටහනින් දක්වෙන්නේ පෘථිවි ජල ගෝලයේ අවස්ථා කිහිපයකි.



(i) A හා B වලින් දක්වෙන ජල ව්‍යාප්ති අවස්ථා දෙක නම් කරන්න. (ල. 02)

(ii) (a) C වලින් දක්වෙන ජල ව්‍යාප්ති අවස්ථාව කුමක් ද?

(b) ඉහත C වලින් දක්වෙන අවස්ථාව තුළ ජලය අන්තර්ගතව ඇති මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල. 03)

(iii) (a) ජලයේ ගුණාත්මක භාවය අඩුවීම සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.

(b) ජල නාස්තිය හා ගුණාත්මක බව අඩුවීම නිසා අනාගතයේ ඇතිවිය හැකි ජල හිඟය මඟහරවා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(03) (i) පස නිර්මාණය වන ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 02)

(ii) පස නිර්මාණයට බලපාන සාධක තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ හා තෙත් කලාපයේ බහුලව දැකිය හැකි පස් වර්ග දෙක ලියන්න.

(b) ශාක හා සත්ව සංහතියේ පැවැත්ම සඳහා පස වැදගත් වන ආකාරය කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

(04) (i) (a) ලෝකයේ තේ වගා කරන දකුණු ආසියා රටක් ද?

(b) රබර් වගා කරන අග්නිදිග ආසියා රටක් ද නම් කරන්න. (ල. 02)

(ii) තේ හා රබර් වගාවේ ප්‍රවණතා තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) වර්තමානයේ රබර් අපනයනයෙන් ශ්‍රී ලංකාවට ලැබෙන ආදායම අඩුවීමට බලපා ඇති ප්‍රධාන හේතු දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු අංශය මෑතකාලීනව මුහුණපාන ගැටලු දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

- **ප්‍රශ්න අංක 05 සහ 06 ට පිළිතුරු සැපයීම සඳහා පහත සිතියම යොදාගන්න.**

(05) (i) ඉහත සිතියමේ A හා B වලින් දක්වා ඇති තිරිඟු වගා කරන රටවල් දෙක නම් කරන්න. (ල. 02)

(ii) තිරිඟු වගාවේ විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) ලෝක වෙළඳපොළෙහි තිරිඟු ප්‍රධාන භෝගයක් ලෙස වැදගත් වීමට හේතු දෙකක් ලියන්න.

(b) ලෝක ජනතාව අතර තිරිඟු ආහාරයක් ලෙස ජනප්‍රිය වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(06) (i) ලෝකයේ කපු වගා කරන අප්‍රිකානු රටක් හා අතුරු ඇමෙරිකාවේ ප්‍රදේශයක් දැක්වෙන අක්ෂර දෙක පිළිවෙලින් ලියන්න. (ල. 02)

(ii) විද්‍යුත් කර්මාන්තයේ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) මෝටර් රථ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් ලියන්න.

(b) ශ්‍රී ලංකාව තුළ මෝටර් රථ කර්මාන්තය දියුණු කිරීමට පවතින බාධක දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(07) (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට හේතු වන වායු වර්ග දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන

(a) මිනිස් ක්‍රියාකාරකම් දෙකක්

(b) ස්වභාවික හේතුවක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) දේශගුණික වෙනස්වීම් නිසා මානුෂ කටයුතුවලට ඇතිවන අහිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(b) දේශගුණික වෙනස්වීම් මගින් ඇතිවන බලපෑම් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(08) ලෝකයේ ජනාධික හා ජන හීන ප්‍රදේශ කිහිපයක් පහත දැක්වේ.

* මධ්‍යම ඕස්ට්‍රේලියාව * මධ්‍යම ආසියාව * උතුරු කැනඩාව
* දකුණු ආසියාව * නැගෙනහිර ආසියාව

(i) ඉහත ප්‍රදේශ අතරින් ජනාධික ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) (a) ඉහත ඔබ නම් කළ ප්‍රදේශ දෙක තුළ පිහිටා ඇති මිලියන නගර එක බැගින් සඳහන් කරන්න.

(b) ජන සංඛ්‍යා ව්‍යාප්තියට බලපාන භෞතික සාධක එකක් සඳහන් කරන්න. (ල. 03)

(iii) (a) 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයෙහි කැපීපෙනෙන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියේ අසමානතා අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)



(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (ඉ) / (C)



(i)

(ii)

(iii)

(iv)

(v)

/5

01 (අ)(A) /10 + (ආ)(B) /5 + (ඉ)(C) /5 = /20

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

ශ්‍රේණිය/Grade : ....

විභාග අංකය
சுட்டெண்
Index Number ....

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි.
பரீட்சகரின் உபயோகத் துக்கு மட்டும்
For Examiner's Use Only

(01) (அ) (A)

(i) ....

(ii) ....

(iii) ....

(iv) ....

(v) ....

(vi) ....

(vii) ....

(viii) ....

(ix) ....

(x) ....

10

මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

පිළිතුරු පත්‍රය - I පත්‍රය

01 510
02 මොහොරොවිසික්
03 මෙසෝ
04 චර්නෝසම්
05 ඉල්මනයිට්
06 චීනය
07 භූ විද්‍යාත්මක
08 හවායි
09 ජෛව ස්කන්ධ
10 1000
11 නි
12 වැ
13 නි
14 වැ
15 නි
16 ආක්ටික්
17 ධමනි
18 පැසිපික්
19 7
20 ජාලාකාර
21 නුවරඑළිය
22 සමෝච්ඡ රේඛා
23 අභ්‍යන්තර
24 3
25 රාෂ්ට්‍රීය
26 (3)
27 (4)
28 (1)
29 (2)
30 (3)
31 (3)
32 (2)
33 (1)
34 (1)
35 (2)
36 (3)
37 (2)
38 (1)
39 (3)
40 (4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්) (ලකුණු 40)

II පත්‍රය

I - කොටස

(01) (අ) (i) තීර්යක් නිම්නය (ii) අවතල බෑවුම (iii) අක්ෂාංශ දේශාංශ ඡේදනය
(iv) පයිනස් (v) මං සන්ධිය (vi) 3 යි.
(vii) නිරිත දිශාවට (viii) නි (ix) වැ
(x) වැ (ලකුණු 10)

(ආ) (i) B (ii) F (iii) H (iv) K (v) R (ලකුණු 05)

(ඉ) (i) A (ii) F (iii) J (iv) M (v) P (ලකුණු 05)

II - කොටස

(02) (i) A ග්ලැෂියර් B භූගත ජලය (ලකුණු 02)

(ii) (a) ප්‍රයෝජනයට ගත හැකි මතුපිට ජලය
(b) විල් / පාංශු ජලය / ජලවාෂ්ප / ගංගා / ජීවී සිරුරු තුළ (ලකුණු 03)

(iii) (a)
* අපවිත්‍ර කාර්මික ජලය පිටකිරීමේ දී විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය මුසුවීම.
* කෘෂිකර්මාන්තයේ දී භාවිතා කරන පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය ජලය සමග මිශ්‍ර වීම.
* මල ද්‍රව්‍ය අපවහනයේ දී භූගත හා මතුපිට ජලයට අපද්‍රව්‍ය එකතුවීම.
* ගෘහස්තව බැහැර කරන කැලිකසල දිරාපත් විමෙන් කාබනික ද්‍රව්‍ය එකතු වීම.

(b)
* අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
* වැසි ජලය එක්රැස් කර තබාගැනීම.
* ජනතාව දැනුවත් කිරීම.
* ජල මූලාශ්‍ර සංරක්ෂණය ආදී...... (ලකුණු 05)

(03) (i) ඓන්ද්‍රිය ද්‍රව්‍ය දීර්ඝ කාලයක් තිස්සේ දිරාපත් වීමෙන් හා පාෂාණ ජීර්ණය මගින් සැපයෙන ජීර්ණාවශේෂ මිශ්‍ර වීමෙන් (ලකුණු 02)

(ii) මව් පාෂාණ / දේශගුණය / භූ විෂමතාව / කාලය / ශාක හා සත්ව කොටස් / මානුෂ ක්‍රියා (ලකුණු 03)

(iii) (a) වියළි කලාපය - රතු දුඹුරු පස
තෙත් කලාපය - රතු කහ පොඩ්සෝල් පස

(b)
* ජලය සැපයීම * වාතය සැපයීම * ඛනිජ ලවන සැපයීම
* පෝෂ්‍ය පදාර්ථ සැපයීම * කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම (මැටි)
* වාසස්ථාන තනා ගැනීමට * බෝග වගාව සඳහා (ලකුණු 05)

(04) (i) (a) ශ්‍රී ලංකාව / ඉන්දියාව
(b) තායිලන්තය / ඉන්දුනීසියාව / මැලේසියාව / වියට්නාමය (ලකුණු 02)

(ii) තේ වගාවේ ප්‍රවණතා
* රිකිලි තේ ගස ප්‍රචලිත වීම * නිෂ්පාදන විවිධාංගීකරණය
* තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය * විවිධ ඇසුරුම් ක්‍රම ආදී.....

රබර් වගාවේ ප්‍රවණතා
* තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය * දේශීය වශයෙන් නිමි භාණ්ඩ නිපදවීම
* අමුද්‍රව්‍ය ලෙස ඉල්ලුම වැඩිවීම ආදී .... (ලකුණු 03)

(iii) (a)
* දේශීය ඉල්ලුම ඉහළ යාම * නිෂ්පාදන ප්‍රමාණය අඩුවීම

(b)
* ශ්‍රමික හිඟය * ස්වාභාවික ආපදා * නිෂ්පාදන වියදම අධික වීම
* ඉඩම් කැබලි වීම (ලකුණු 05)

(05) (i) A කැනඩාව B ආර්ජන්ටිනාව (ලකුණු 02)
(ii) * ඒක බෝග වගාවක් වීම හා වගා බිම් විශාල වීම
* ලොව පුරා පැතිරුණු වෙළඳපොලක් පැවතීම
* දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතය ආදී ... (ලකුණු 03)
(iii) (a) * ලෝක වෙළඳාමට සම්බන්ධ ප්‍රධාන ධාන්‍ය වර්ගය වීම
* විවිධ දේශගුණ තත්ව යටතේ වගා කළ හැකි වීම
* පිෂ්ඨය බහුල පෝෂ්‍යදායි ආහාරයක් වීම
* වසර පුරාම වෙළඳපොලට තිරිඟු සැපයීම (ලකුණු 02)
(b) * විවිධ ආහාර වර්ග සකස් කළ හැකි වීම
* පහසුවෙන් සකස් කළ හැකි වීම
* සකස් කළ ආහාර කල් තබාගත හැකි වීම
* කුඩා ළමුන්, රෝගීන් සඳහා විශේෂිත ආහාර නිපදවීම (ලකුණු 03)

(06) (i) අප්‍රිකා රට - ඊජිප්තුව - D
උතුරු ඇමෙරිකාවේ ප්‍රදේශය - ටෙක්සාස් - E (ලකුණු 02)
(ii) * විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කිරීම
* නිෂ්පාදනයට වැය කරන මුදල මෙන් දෙගුණයක් පර්යේෂණ කටයුතුවලට යෙදවීම
* ශ්‍රමිකයන් විශාල පිරිසක් විද්‍යාඥයින්, ඉංජිනේරුවන් වැනි අය වීම (ලකුණු 03)
(iii) (a) * ඉන්ධන පිරිමැස්ම * පරිසර හිතකාමී මෝටර් රථ නිපදවීම
* නව උපාංග සම්බන්ධ වීම * මාදිලිය වෙනස් වීම ආදී....
(b) * විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කළ නොහැකි වීම
* තාක්ෂණය ප්‍රමාණවත් නොවීම
* බුද්ධිමය ශ්‍රමය හිඟවීම (ඉංජිනේරු, තාක්‍ෂණික ශිල්පීන්, පර්යේෂකයන්) (ලකුණු 05)

(07) (i) * CFC * මීතේන් * නයිට්‍රස් ඔක්සයිඩ් * CO_2 (ලකුණු 02)
(ii) (a) * පොසිල ඉන්ධන භාවිතය * වන හායනය
* කාර්මීකරණය * සත්ව පාලනය ආදී ....
(b) * ගිනිකඳු පිපිරීම * ස්වභාවික වගුරුබිම්
* ලැව්ගිනි * සූර්ය ලප ආදී .... (ලකුණු 03)
(iii) (a) * මත්ස්‍ය අස්වැන්න අඩුවීම
* බිම් ලවණීකරණය වීම නිසා වගාබිම් අඩුවීම
* අස්වැන්න අඩුවීම
* පානීය ජල දූෂණය ආදී ....
(b) * හරිතාගාර වායු පිටකරන බලශක්ති ප්‍රභව භාවිතය අඩු කිරීම
* පුනර්ජනනීය බලශක්ති භාවිතය
* වන වගාව ව්‍යාප්ත කිරීම
* ඝන අපද්‍රව්‍ය කළමනාකරණය (ලකුණු 05)

(08) (i) * දකුණු ආසියාව * නැගෙනහිර ආසියාව (ලකුණු 02)
(ii) (a) දකුණු ආසියාව - දිල්ලිය / මුම්බායි / කොල්කටා / චෙන්නායි / කරච්චි / ඩකා
නැගෙනහිර ආසියාව- බීජිං / ෂැංහයි / ග්වාංෂු / ටෝකියෝ / සෝල්
(b) * දේශගුණය * භූ විෂමතාව * ජලය
* සරු පස * ඛනිජ සම්පත් (ලකුණු 03)
(iii) (a) * අවුරුදු 15 ට අඩු ජන සංඛ්‍යාව අඩුවීම * අවුරුදු 60 ට වැඩි ජන සංඛ්‍යාව වැඩිවීම
* ශ්‍රම බලකාය අඩුවීම * ස්ත්‍රී ජන සංඛ්‍යාව වැඩිවීම
(b) * යටිතල පහසුකම් දියුණු කිරීම * කර්මාන්ත ප්‍රාදේශීයකරණය
* සේවා කටයුතු ප්‍රතිව්‍යාප්ත කිරීම * නැවත පදිංචි කිරීම ආදී... (ලකුණු 05)